www.AlevelApi.com

AL/2024/29/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය தொடர்பாடலும் ஊடகக் கற்கையும் Communication & Media Studies	II II II	29 S II

පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours	අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න යංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:
* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **40**කි.

1. සන්නිවේදන අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම ජනමාධ්‍ය පිළිබඳව ද අවධානය යොමු කෙරේ.

(i) 'සන්නිවේදන අධ්‍යයනය' නම් ස්වාධීන විෂයයේ සංවර්ධනයට පසුබිම සකස් කළ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග ලෙස සැලකෙන ආකේතකරණයේ දී හා විකේතකරණයේ දී සිදුවන්නේ කුමක් දැයි වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ජනසන්නිවේදනයේ පවත්නා විශේෂතා **හතරක්** අන්තර්පුද්ගල සන්නිවේදනය හා සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 16)

2. (i) මානව සන්නිවේදනයේ දී නාලිකා ලෙස භාවිත කරන්නේ මොනවා ද? (ලකුණු 04)

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණශීලී රචනය පහත සාධක ඇසුරෙන් ලුහුඬින් විස්තර කරන්න.

(අ) නිර්මාණශීලී රචනාවක අරමුණු

(ආ) නිර්මාණශීලී රචනා වර්ග

(ඉ) නිර්මාණශීලී භාෂා ශෛලිය (ලකුණු 12)

(iv) මහජන සම්බන්ධතා මෙවලම් **දෙකක්** හා විධික්‍රම **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

3. පාසල් සිසුන්ගේ කාව්‍ය නිර්මාණ ඇතුළත් කර සම්පාදනය කළ ග්‍රන්ථයක දොරට වැඩුම සඳහා සහභාගී වීමට ඔබට ආරාධනයක් ලැබී ඇත.

(i) කාව්‍ය නිර්මාණකරණය සඳහා භාවිත වන සන්නිවේදන වර්ගය කුමක් ද? (ලකුණු 04)

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කරන ලද සන්නිවේදන වර්ගය භාවිත කිරීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණකරණය සඳහා වැදගත්වන ගුණාංග දෙකක් පහතින් දැක්වේ. ඒවා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(අ) පරිකල්පනය

(ආ) සතතාභ්‍යාසය (ලකුණු 12)

(iv) දොරට වැඩුම උත්සවය සංවිධාන කිරීම සඳහා සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් එම උත්සවය සැලසුම් කිරීමට අදාළ කාර්ය **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න

Alevel Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. සංවර්ධනය හා සංස්කෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සන්නිවේදනය සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී.

(i) සංවර්ධන කාර්යයේ දී ඒ ඒ රටවලට යෝග්‍ය වූ විධික්‍රම අදාළ රටවල් විසින්ම නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම හැඳින්වීම සඳහා භාවිත යෙදුම කුමක් ද? (ලකුණු 04)

(ii) 'සංස්කෘතිය' යන්න ඊ. බී. ටයිලර්ගේ නිර්වචනය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පාර්ශ්ව දෙකක් හෝ කිහිපයක් අතර ඇති විය හැකි ගැටුම් නිරාකරණය කිරීම සඳහා පහත පියවර යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

(අ) ගැටුම අවබෝධ කර ගැනීම

(ආ) විසඳුමක් තෝරා ගැනීම

(ඉ) මැදිහත්කරුවකු ලෙස තෙවන පාර්ශ්වයක් යොදා ගැනීම (ලකුණු 12)

(iv) ජනප්‍රිය සංස්කෘතියේ දක්නට ලැබෙන පහත ලක්ෂණ රූපවාහිනී මාධ්‍යට විශේෂිතව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) නොගැඹුරු හා සරල වීම

(ආ) මහා පරිමාණිකව නිෂ්පාදනය වීම

(ඉ) කලාත්මක මට්ටම හීන වීම

(ඊ) සදාචාරාත්මක ගැටලුවලට හේතු වීම (ලකුණු 16)

5. 'මාධ්‍ය නියාමනයේ සමාජ අවශ්‍යතාව' මැයෙන් සිදුකරන මත විමසීමේ සමීක්ෂණයක දත්ත රැස්කරන්නෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ යැයි සිතන්න.

(i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය නියාමන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මූලික සමීක්ෂණ වර්ග **දෙක** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සමීක්ෂණය සඳහා දත්ත රැස්කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පහත කරුණු යටතේ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(අ) මහජන සාමය ආරක්ෂා කිරීම

(ආ) තනි පුද්ගල අයිතීන්ට සිදු වන බලපෑම පාලනය කිරීම (ලකුණු 16)

6. මානව සන්නිවේදන ක්‍රියාවලිය කාලානුරූපීව නවීකරණය වෙයි.

(i) සම්ප්‍රදායික මාධ්‍යවල ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදනය සඳහා භාවිත සමාජ මාධ්‍ය යෙදවුම් **දෙකක** ක්‍රියාකාරිත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමේ දී කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) යොදා ගත හැකි ආකාරය පහත අවස්ථාවලට විශේෂිතව විස්තර කරන්න.

(අ) ගීත නිර්මාණකරණය

(ආ) රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම (ලකුණු 12)

(iv) නිර්මාපරිමාණකරණයේ ලක්ෂණ පහත මාධ්‍යවලට විශේෂිතව නිදසුන් දක්වමින් පහදන්න.

(අ) මුද්‍රිත මාධ්‍ය

(ආ) සමාජ මාධ්‍ය (ලකුණු 16)

7. මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය අතර සමීප සම්බන්ධතාවක් පවතී.

(i) සාක්ෂරතාව යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ඥාන ව්‍යුහ ගොඩනඟා ගැනීමට තොරතුරු ඉවහල්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය හා සම්බන්ධ ස්ත්‍රීවාදී විචාරයෙහි ඔබ හඳුනා ගන්නා ප්‍රධාන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීම සඳහා පහත අංග යොදා ගන්නා ආකාරය උදාහරණ ඇසුරෙන් විමසන්න.

(අ) අදාළ බව (ආ) පෙළඹවීම

(ඉ) විශ්වසනීයත්වය (ඊ) විකෘතිකරණය (ලකුණු 16)

***

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.